**නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (අදියර 01) - 2019**

---

නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ (අදියර 01) 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රංශ සංවර්ධන ආයතනය(Agence Francaise De Development) අතර 2016 ජුනි 01 දින එළඹි අංක සීඑල්කේ 1013 – 01 කේ දරන ණය පහසුකම් ගිවිසුමේ 3.4.3 (එච්) වගන්තිය සහ 2016 මාර්තු 16 දින එළඹි අංක සීඑල්කේ 1013-02 එල් දරන මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය පහසුකම් හා මූල්‍ය ගිවිසුම් අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු (අ) අප ජලය රැස්කිරීම හා පිරිපහදු පද්ධති ව්‍යාප්ත කිරීම සහ මීගමුව මහ නගර සභා බල ප්‍රදේශයේ 73,000 ක් වූ ජනතාවට සනීපාරක්ෂක සේවා ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථා වැඩි දියුණු කිරීම (ආ) ජල හා සනීපාරක්ෂ අංශයේ ව්‍යුහය වැඩි දියුණු කිරීම හා විශ්ලේෂණය කිරීම (ඇ) දරිද්‍රතාව පිටු දැකීම සඳහා අවැසි දිළිඳු හිතකාමී ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම මගින් වරප්‍රසාද නොලත් නිවැසියන්ට සේවා ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථා සැලසීම (ඇ) වෙරළාශ්‍රිත හා නාවික පරිසර පද්ධති ආරක්ෂාව සහ ජෛව විවිධත්ව නඩත්තුව සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීම වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,739.81 කට සමාන යූරෝ මිලියන 107.70 ක් වන අතර ඉන් රු.මිලියන 13,224 කට සමාන යූරෝ මිලියන 76 ක් ණයක් වශයෙන් සහ රු.මිලියන 991.81 කට සමාන යූරෝ මිලියන 5.70 ක් ප්‍රදානයක් වශයෙන් මූල්‍යයනය කිරීමට ප්‍රංශ සංවර්ධන ආයතනය එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 4,524 කට සමාන යූරෝ මිලියන 26 ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජුනි 01 දින ආරම්භ කරන ලද අතර 2022 ජුනි 30 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 02 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මඟින් 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය සියළු ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩුව

| ගිණුම්කරණ අඩුපාඩුව | වටිනාකම රු.මිලියන | බලපෑම | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාව අනුව, 2019 දෙසැම්බර් 31 දිනට සෘජු ගෙවීම් වටිනාකම රු.මිලියන 435.56කට සමාන යුරෝ මිලියන 2.17 ක් විය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල එය රු.මිලියන 540.86කට සමාන යුරෝ මිලියන 2.69 ක් ලෙස දක්වා තිබුණි. ව්‍යාපෘති කාර්යාලය විසින් රු.මිලියන 105.29 කට සමාන යුරෝ මිලියන 0.52 ක වෙනස හඳුනාගෙන සැසඳුම් සකස් කර තිබුණ ද, ව්‍යාපෘති කාර්යාලය විසින් හෝ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සෘජු ගෙවීම්වල නිවැරැදි අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | 105.29 | සැසඳුම් නොකල ශේෂයන් මගින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වැරදි අර්ථ නිරූපණයක් ලබා දෙයි. | 2019 වර්ෂයේ අවසන් සෘජු ගෙවීම් හතර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් වාර්තා කර නොගැනීම හා විනිමය වෙනස්කම් මෙයට හේතු පාදක විය. | ශේෂයන් සැසඳීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

.

| | ක්‍රියාකාරකම | 2019 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය | | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත | සත්‍ය | | | |
| (අ) | මීගමුව අප ජල අපහරණ පද්ධතිය සඳහා පොම්පාගාර සහිත අපජල එකතු කිරීමේ පද්ධති ඉදි කිරීම හා නිවාස සබඳතා ලබා දීම. | 2019 වර්ෂයේ සැප්තැම්බර් මස වන විට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සැලසුම් කර තිබුණි. | 2020 අගෝස්තු 31 දින වන විටත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. | මීගමුව ප්‍රදේශයේ සනීපාරක්ෂක සේවා වැඩි දියුණු කිරීම් ප්‍රමාද වීම. | මූලික ප්‍රමාදය සැලසුම් හා අධීක්ෂණ උපදේශන කොන්ත්‍රාත්තුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය නිසා සිදු | ණය කාල සීමාව 2020 ජුනි මස අවසන් වන නිසා ව්‍යාපෘති කාර්යයන් කඩිනම් කිරීමට ක්‍රියා |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | විය.කෙසේ වුවද, අප්‍රේල් 21 සිදුවීම් සහ කොවිඩ් - 19 වසංගත ව්‍යාප්තිය නිසා සැලසුම් සම්පූර්ණ කිරීමට නොහැකි විය. | කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘති ප්‍රදේශය තුළ වෙසෙන අඩු අදායම් ලාභීන්ගේ සනීපාරක්ෂක පහසුකම් වර්ධනය කිරීම. | 2018 ජුනි මස වන විට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සැලසුම් කර තිබුණි. | 2020 අගොස්තු 31 දින වන විටත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. | ව්‍යාපෘති ප්‍රදේශය තුළ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම් ප්‍රමාද වීම. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ මූලික ප්‍රමාදය සිදු විය. ව්‍යාපෘතියේ සමස්ත ඉලක්ක කෙරෙහි මෙම ප්‍රමාදය බලපෑම් නොකරයි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | ප්‍රතිපත්ති හා ආයතනික වැඩි දියුණු කිරීම් උපදේශනය (පී.අයි.ඊ.සී) | 93% | 32% | මලාපවහන අංශයේ ප්‍රතිපත්ති හා ආයතනික ව්‍යුහය වැඩි දියුණු කිරීම් කටයුතු ප්‍රමාද වීම. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ සිදු වූ ප්‍රමාදය, මූලික ප්‍රමාදයට හේතු විය. නව ඉලක්කගත දිනය 2020.09.05 වේ.කෙසේ වුවද, කොවිඩ් 19 වසංගත ව්‍යාප්තිය මෙම කොන්ත්‍රාත්තුව කෙරෙහි බලපා ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | මලාපවහන කළමනාකරණ කුසලතා වර්ධන උපදේශනය (එස්.එම්.එස්.ඩී.සී) | 2018 නොවැම්බර් මස වන විට ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර නැත. | ප්‍රසම්පාදනය ප්‍රමාදවීම ව්‍යාපෘති අරමුණු කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැක. | මෙම කොන්ත්‍රාත්තුවේ ටෙන්ඩර් ලේඛන සැකසීම ප්‍රතිපත්ති හා ආයතනික වැඩි දියුණු කිරීම් උපදේශකගේ(PIEC) වගකීමක් වන අතර මූලික ප්‍රසම්පාදන ප්‍රමාදය නිසා ප්‍රතිපත්ති හා ආයතනික වැඩි දියුණු කිරීමේ උපදේශන කොන්ත්‍රාත්තුව(PIEC) ප්‍රදානය කිරීම | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | ප්‍රමාද වීම මෙහි කාර්ය ආරම්භ කිරීමේ ප්‍රමාදයට හේතු විය. | |
| (ඉ) | සැලසුම් හා අධීක්ෂණ උපදේශන (ඩී.එස්.සී) | 61% (මීගමුව, ගාල්ල සහ කැළණියේ ශක්‍යතා අධ්‍යනයන් කිරීම) | 25% (ප්‍රදේශ තුනෙහි ශක්‍යතා අධ්‍යනයන් කෙරෙමින් පවතී.) | කොන්ත්‍රාත් ප්‍රදානය ප්‍රමාද වීම ව්‍යාපෘති අරමුණු කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැක. | මූලික ප්‍රමාදය ප්‍රසම්පාදනයේ ප්‍රමාදය නිසා සිදු විය. මෙම කොන්ත්‍රාත්තුව 2018.08.21 දින ආරම්භ කරන ලද අතර ඒ අනුව සැලසුම් හා ලංසු ලේඛන 2020 පෙබරවාරි වන විට සිදු කිරීමට අපේක්ෂා කරන ලදි. නමුත්, ඩ්‍රෝන සමීක්ෂණ (drone Surveys) තහනම් කිරීම, විවිධ රටවල් අතර සංචාරය තහනම් කිරීම, ආරක්ෂාව සම්බන්ධ ගැටළු සහ කොවිඩ් 19 වසංගත ව්‍යාප්ති තත්ත්වයන් මත මෙම කොන්ත්‍රාත්තුව සැලසුම් මට්ටමට පසුගාමී විය. 2021.01.20 තෙක් කාල දිගුව ලබා දී ඇත. | කාර්යය කඩිනම් කිරීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |
| (ඊ) | ඉඩම් අත්පත් කර ගැනීම. | මීගමුව ඉඩම් 12, ගාල්ලේ ඉඩම් 17 ක් හා උණවටුන ඉඩම් 07 ක් | ඉඩම් අත්පත් කර ගැනීම් ක්‍රියාවලිය සිදු කරමින් පවතී. | ඉඩම්වල හිමිකම පැවරීම ප්‍රමාදවීම ව්‍යාපෘතියට අහිතකර ලෙස බලපෑ හැක. | ඉදි කිරීම් ආරම්භ කිරීමට ප්‍රථම ඉඩම්වලට ප්‍රවිශ්ය වීමේ හැකියාව තහවුරු කර ගන්නා ලදී. | ඉඩම්වල හිමිකම පවරා ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ගිවිසුම් අත්සන් කරන ලද 2016 වර්ෂයේ සිට වර්ෂ දෙකකට පසු, 2018 වර්ෂයේ ණය උපයෝජනය ආරම්භ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ණය නියෝජිතායතනය විසින් 2019 දෙසැම්බර් 31 දින දක්වා උපයෝජනය නොකළ ණය ශේෂය මත බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 238 ක් අය කරගෙන තිබුණි. | ශ්‍රී ලංකා රජයට අතිරේක පිරිවැයක් දැරීමට සිදු විය හැක. | සැලසුම් හා අධීක්ෂණ උපදේශන කොන්ත්‍රාත්තුවේ ප්‍රසම්පාදනය ප්‍රමාද වීම හේතුවෙන් සිදු වූ මූලික ප්‍රමාදය නිසා කාර්ය ආරම්භ කිරීම හා ණය උපයෝජනය ආරම්භ කිරීම ප්‍රමාද විය. | උපදේශන කොන්ත්‍රාත්තු කඩිනම් කිරීමට ක්‍රියා කල යුතුය. |

**3.3 මතභේදයට තුඩු දෙන කරුණු**

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ගාල්ල දිස්ත්‍රික්කයේ අපජල පිරිපහදු පිරියත ඉදිකිරීමට සැලසුම් සකස් කර තිබූ අතර පිරිපහදු පිරියතේ සැලසුම් කිරීමේ කොටස මෙම ව්‍යාපෘතිය මගින් නිම කිරීමට නියමිත විය. තවද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඒ සඳහා ඉඩමක් තෝරාගෙන තිබූ අතර අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය 2014 වර්ෂය අවසානයේ අරඹා 2019 ජුනි 17 වන විට නිම කර තිබුණි. කෙසේ වුවද, ඉඩම් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවා තිබූ අත්තිකාරම් මුදල් ආපසු අය කර ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ගොනු කරන ලද නඩුවේ තීන්දුව ප්‍රමාද වීම මත 2020 ජුනි 30 දින වන විටත් ඉඩමේ නිත්‍යානුකූල හිමිකම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරා ගෙන නොතිබුණි. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අතිරේක පිරිවැයක් දැරීමට සිදුවිය හැක. | 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පනතේ 92 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ගාල්ල මහ නගර සභා බල ප්‍රදේශයේ අපජල පිරිපහදු පිරියතක් ඉදි කිරීම සඳහා ගාල්ල කඩවත් සතර, දඩල්ල ප්‍රදේශයේ පිහිටි අක්කර 4 පර්චස් 33 ක් සහිත කනත්තවත්ත නම් ඉඩම අත්පත් කර ගැනීම සඳහා අමාත්‍යවරයාගේ නියෝග මත පල කරන ලද ගැසට් පත්‍රය (2013/11/13 දිනැති අංක 1836/16) මගින් අනුමැතිය දී තිබුණි.<br>අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අතරතුරදී, මණ්ඩල තීරණයක් මත ඉහත කී ඉඩම මිලදී ගැනීමට ක්‍රියා කරන ලදී. කෙසේ වුවද, නීතිමය ගැටළුවක් මත ඉඩම් මිලදී ගැනීම අත්හිට වූ අතර ගෙවන ලද අත්තිකාරම් මුදල නීතිමය ක්‍රියා මාර්ග මගින් ආපසු අය කර ගැනීමට විධි විධාන යොදන ලදී. තෝරා ගන්නා ලද ඉඩම අදාල අරමුණ සඳහා තාක්ෂණික වශයෙන් වඩා සුදුසුම ඉඩම බැවින් ගරු ඇමතිතුමාගේ නියෝග මත අත්පත් | ඉඩම් අත්පත් කර ගැනීම ඵලදායිව, ආර්ථිකව හා කාර්යක්ෂම අයුරින් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කර ගැනීම සඳහා නැවතත් ගැසට් නිවේදනයක් (2015/04/01 දිනැති අංක 1908) නිකුත් කරන ලදී. ඒ අනුව 2018 මැයි 8 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත කරුණු තීරණය කරන ලදි.<br>1. 1994 හා අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වගන්තිය යටතේ ඉහත සඳහන් ඉඩම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා ගැනීමට (ගාල්ල අපජල කලමනාකරණ පද්ධතියේ අධ්‍යන අදියර මෙම ව්‍යාපෘතිය යටතට පැමිණීම මත, ව්‍යාපෘති කලමනාකරණ ඒකකය මගින් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය පමණක් සමීපව අධීක්ෂණය කෙරේ.)<br>2. නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත, ජේ.එම්. කරුණාරත්න මහතාට පෙර ගෙවන ලද අත්තිකාරම් මුදල නැවත අය කර ගැනීම සඳහා ආරම්භ කර ඇති නීතිමය ක්‍රියා මාර්ග ඉදිරියට ගෙන යාම හා ඉඩම මිලදී ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව විනය ක්‍රියා මාර්ග ගැනීම. | |

**3.4 පද්ධති හා පාලන**

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අගය දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ----------------------- | ------------ | ------------------- | -------------------- |
| මුදල් රෙගුලාසි 133 සහ 2016 ජුනි 10 දිනැති කලමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ කලමනාකරණ විගණන චක්‍රලේඛ අංක 02/2016 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ගනුදෙනු අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි. | අභ්‍යන්තර පාලන පද්ධතියේ දුර්වලතාවයකි. | අදහස් දක්වා නොමැත. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |